# පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවල ඇතැම් අංශ

**කාමෙනා ගුණරත්න**

### හැඳින්වීම

පාරිසරික ආරක්ෂාවට හා කළමනාකරණයට අදාල වූ ප්‍රථම විස්තරාත්මක ව්‍යවස්ථාව වන ජාතික පාරිසරික පනත 1980 දී සම්මත කරන ලදී. එය නීතිගත කරනු ලැබූ අවස්ථාව වන විට, පරිසරයට අදාළ වූ විධි විධාන සහිත විවිධ නීති පණහක් පමණ රටේ තිබුණි. මේවා අවුරුදු එකසිය පනහකටත් අධික කාල සීමාවක් තුළදී එකතු වුණු ඒවා වූ අතර ඉන් බොහොමයක් බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී සම්මත කරන ලද ඒවාය. මෙකී ව්‍යවස්ථාවලින් බොහෝමයක් ම අතිරික්ත හෝ අදාළ නැති ඒවා වන අතර, ඒවා එකිනෙකට වෙනත් පරමාර්ථ උදෙසා විවිධ කාල සීමාවන් තුළදී නීතිගත කරුණු නිසාත් විවිධ ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන නිසාත් පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ විධි විධාන ඒවායේ ඇතුළත් නොවේ.

පාරිසරික කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නයට රජයේ දැඩි අවධානය යොමු වන්නට පටන් ගත්තේ 1970 දශකයේ මුල් භාගයේදීය. වර්ෂ 1975 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන සැලසුම්කරණ සහ ස්කැප් යන සංවිධාන වල දූත පිරිසක් විසින් රටේ පාරිසරික ගැටළු පිළිබඳව කරන ලද අධ්‍යයනයකින් තීරණය කරන ලද්දේ පරිසරයට අදාළ සියලු කරුණු සම්බන්ධීකරණය කළහැකි ප්‍රධාන නියෝජ්‍යායතනයක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් බවය. පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් 1980[3] දී රජයේ අනුග්‍රහයෙන් පවත්වන ලද සම්මන්ත්‍රණයකට පසුව ජාතික පාරිසරික පනත සම්මත කරනු ලැබූ අතර, එහි විධි විධාන සලසන ලද්දේ එකී සම්මන්ත්‍රණයේ නිර්දේශ පදනම් කරගෙනය. ශ්‍රී ලංකාව තුළ පාරිසරික ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය සම්බන්ධීකරණය කිරීමේ නියෝජ්‍යායතනයක් වශයෙන් මධ්‍යම පරිසර අධිකාරිය මේ මගින් පිහිටුවනු ලැබූ අතර, බෙහෙවින් අවශ්‍යව තිබූ ආයතනයක් මේ මගින් ඇතිවිය.[2]

පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ කාර්ය පටිපාටියක් මුල් පනතට ඇතුළත් නොවූ බැව් සැළකිය යුතුය. රජයේ මෙන් ම විරුද්ධ පක්ෂයේ ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වූ මහජන යහපත පිළිබඳ උනන්දුවක් දැක් වූ කණ්ඩායමක් විසින් කරන ලද බලපෑම් හේතුකොටගෙන මෙය වර්ෂ 1988[4] දී සම්මත කරන ලද සංශෝධනයක් මගින් විශාල වශයෙන් රට ඇතුළත් කරනු ලැබිණ. සංවිධාන වලින් ඉල්ලා සිටින ලද පරිදි පුරවැසි නඩු විධි විධාන රට ඇතුළත් නොකරනු ලැබූ නමුදු මූලික පාරිසරික විමර්ශන වාර්තා සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා මහජනයාට ලබාගත හැකිවීම, විවේචන එවීමේ කාලසීමා සහ මහජනතාවට ඇහුම්කන්දීම වැනි පාරිසරික බලපෑම් තක්සේරු කාර්ය පටිපාටිවලට අදාළ වෙනත් බොහෝ විධි විධාන ඔවුන්ගේ යෝජනා මත සංශෝධනයට ඇතුළත් කරන ලදී[5]

පාරිසරික බලපෑම් තක්සේරු වලට අදාල කාර්ය පටිපාටිය පිළිබඳ සම්පූර්ණ විග්‍රහයක් කිරීම මේ ලිපියේ විෂය පථයෙන් බැහැර වන අතර, එවැනි වාර්තාවක හරයේ ඇති වැදගත් අංශ ගැන පමණක් කරුණු දැක්වීමට මින් අපේක්ෂා කෙරේ

### පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක හරය

පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ජාතික පරිසර පනතේ 33 වැනි වගන්තියේ මෙසේ අර්ථ නිරූපණය කෙරේ

"පාරිසරික බලපෑම් තක්සේරුව යන්නෙ යෝජිත නියමිත ව්‍යාපෘතියක පුරෝකථන පාරිසරික ප්‍රතිවිපාක පිළිබඳ ලිඛිත විශ්ලේෂණයක්, ව්‍යාපෘතියේ විස්තරයක් සමග පිළියෙල කරනු ලැබ තිබේ නම්, පාරිසරික පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් සමන්විත එකී ලිඛිත විශ්ලේෂණ අදහස් කෙරෙන අතර, යෝජිත නියමිත ව්‍යාපෘතියේ වැළැක්විය හැකි සහ වැළැක්විය නොහැකි අහිතකර බලපෑම් ද පරිසරයට රට වඩා අඩුවෙන් හානිකර වියහැකි විකල්ප ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් ද එකී විකල්ප ප්‍රතික්ෂේප කරන ලද්දේ මක්නිසාද යන්නට හේතු ද යෝජිත නියමිත ව්‍යාපෘතියට අවශ්‍ය සම්පත් අප්‍රතිවර්ත්‍ය වූ ද මුදා ගැනීමට නොහැකි වූ ද අයුරින් ප්‍රයෝජනයට ගැනීම ද රට ඇතුළත් වේ"

### විකල්ප

පාරිසරික විශ්ලේෂණ පිළිබඳ තර්කයට අවශ්‍ය වෙන්නේ රික්තාකාරයෙන් නොව සියලු සාධාරණ විකල්ප වලට අනුව කරුණු දෙස බැලිය යුතු බවයි. විකල්ප වල වැදගත්කම එක්සත් ජනපදයේ ජාතික පනතට එය ඇතුළත් කරනු ලැබ තිබීමෙන් පෙනී යයි. වෙනම උප වගන්ති දෙකක ම ඒ ගැන සඳහන් වී ඇත. "යෝජිත ක්‍රියාවට විකල්ප" පාරිසරික බලපෑම්ප්‍රකාශයකට ඇතුළත් විය යුතු බවට ජාතික පරිසර පනතේ 102(2) (සී) වගන්තියේ නියමිත කෙරෙන අතර, නියෝජ්‍යායතන විසින් නිර්දිෂ්ට ක්‍රියා මාර්ග සඳහා වූ විකල්ප "අධ්‍යයනය, සංවර්ධනය මහ විස්තර" කරනු ලැබිය යුතු බැව් 102(2) (ඊ) වගන්තියෙන් නියම කෙරේ. එසේම, ජාතික පරිසර පනත යටතේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක නෛසර්ගික අංශයක් නම්, "වඩා අඩුවෙන් හානිකර වියහැකි විකල්ප ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් සහ එකී විකල්ප ප්‍රතික්ෂේප කරන ලද්දේ මක්නිසාද යන්නට හේතු ද" යන්නයි.

එක්සත් ජනපදයේ[5] පාරිසරික තත්ත්වය පිළිබඳ මණ්ඩලය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ (විකල්ප පිළිබඳ වගන්තිය) පාරිසරික බලපෑම් ප්‍රකාශයේ හදවතයි. සාපේක්ෂ ආකාරයෙන් එමගින් යෝජනාවේ සහ විකල්පවල පාරිසරික බලපෑම් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මෙයින්, විසඳිය යුතු ප්‍රශ්න තියුණු ලෙස පැහැදිලි වියයුතුවාක් මෙන් ම තීරණ ගන්නා තැනැත්තා සහ මහජනයාට විකල්ප තෝරා ගැනීම සඳහා පැහැදිලි පදනමක් ද ඉන් ලබා දිය යුතුය. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලින් ද යෝජිත ක්‍රියාමාර්ග සහ සාධාරණ විකල්ප පිළිබඳ විධි විධාන සැලසේ.[6]

විද්වත් ලේඛකයන් විසින් ද විකල්ප වල වැදගත්කම අවධාරණය කරනු ලැබ ඇති අතර. පාරිසරික බලපෑම් ප්‍රකාශයෙන් යෝජිත ක්‍රියාවට ඇති විකල්ප කෙරෙහි සැළකිල්ල යොමු විය යුතු යැයි කෙරෙන නියමය ඉතා වැදගත් බැව් පෙන්වා දෙනු ලැබ ඇත. ව්‍යාපෘතියක් නියමාකාරයෙන් අගැයීම බෙහෙවින් ම රඳා පවතින්නේ වෙනත් ශක්‍ය චර්යා ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් මතය. විකල්ප පිළිබඳ ප්‍රමාණවත් අයුරින් සාකච්ඡා කිරීම නිසා ව්‍යාපෘතියේ කොටසක් බවට පත් කරනු ලැබිය හැකි සැහැල්ලු කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් විය හැකිය.

**සාකච්ඡා කරනු ලැබිය යුත්තේ කවර විකල්පද?**

විකල්ප ගැන සාකච්ඡා කිරීම, පාරිසරික බලපෑම් ප්‍රකාශයේ අනිවාර්ය අංගයක් සේ සලකා බලන විට ඊලගට මතුවන ප්‍රශ්නය නම්, සාකච්ඡා කරනු ලැබිය යුතු විකල්ප මොනවාද? සහ ඒ කවර ප්‍රමාණයකටද යන්නයි. මෙය එක්සත් ජනපද අධිකරණයේදී බොහෝ අවස්ථාවලදී පැන නැගුණා වූ ද අධිකරණයේ අවධානයට ලක් වූවාවූ ද ප්‍රශ්නයකි.

බලපෑම් ප්‍රකාශයට කවර විකල්ප ඇතුළත් විය යුතු ද යන ප්‍රශ්නය ජාතික සම්පත් ආරක්ෂක මණ්ඩලය එරෙහිව මෝර්ටන්(8) හිදී සළකා බලන ලදී. සංචාරක දිස්ත්‍රික් අධිකරණයේ මතය වූයේ සාකච්ඡා කිරීම සඳහා අවශ්‍ය වූ විකල්ප නම් සාධාරණව ලබා ගත හැකිව තිබෙන ඒවාය යන්නත් විකල්ප වල පාරිසරික බලපෑම ගැන සාකච්ඡා කිරීම අත්‍යන්ත වශයෙන් සිදු කිරීමට අවශ්‍ය නැති බවත්ය. කෙසේ වෙතත්, විකල්ප තුළින් ගැටළුවට සම්පූර්ණ විසඳුමක් නොලැබෙන හෙයින් ඒවා නොසලකා හැරිය හැකිය. යන අභියාචකයන්ගේ තර්කයට ද අධිකරණය එකග නොවූ අතර එකී ක්‍රියාව. ප්‍රකාශය ලබන අවසාන තීරණ ගන්නන්ගේ විෂය සීමාවට අයත් වෙන බව පෙන්වා දුන්නේය. එබැවින්, යෝජනාව සහ විකල්ප යන දෙකෙහිම පාරිසරික බලපෑම්. ප්‍රකාශය මගින් ඔවුන්ට සපයනු ලැබිය යුතුය. අවසාන විශ්ලේෂණයේදී විකල්ප පිළිබඳ අවශ්‍යතාව යුක්ති සහගත භාවයක් ගොඩ නැගීමට යටත් වේ. පාරිසරික බලපෑම් එක්වර ම සොයා දැනගැනීමට නොහැකි විට සහ විකල්පයන් සම්බන්ධයෙන් තොර අපේක්ෂාකාරී ශක්‍යතා වන විට අදහස් දැක්වීම්වලදී ඉදිරිපත් කෙරෙන විකල්පවල පාරිසරික බලපෑම් ගැන විස්තරාත්මක සාකච්ඡා පැවැත්විය යුතු යයි නියම කිරීමට ජාතික පරිසර පනතින් අදහස් නොකෙරේ.

මේ නඩුවේ දැක්වෙන හේතු පිරික්සුම් රීතියෙන් විකල්ප ගැන සාකච්ඡා කිරීම බැහැර නොකෙරන බව ඉන්පසුව ඇති වූ නඩුවලදී පිළිගෙන ඇත. ඒවාට හුදෙක් පහත සඳහන් කරුණු හේතු වේ.

(අ) මෙවැනි විකල්ප ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම වෙනත් නිලධාරියෙකු මත රඳා පවතී.

(ආ) ගැටළුවට පූර්ණ විසඳුමක් විකල්පයෙන් නො සැපයේ.

(ඇ) ඒවාට, ආයතනයේ දූත කාර්යය සඳහා මූලික වශයෙන් නව ප්‍රවේශයක් අවශ්‍ය වේ

(ඈ) ඒවා ක්‍රියාත්මක කිරීමට කාලය ගතවනු ඇත. (නිදසුනක් වශයෙන්, මැණික් ගග හැරවීමේ යෝජනා ක්‍රමය අසාර්ථක වීමට හේතුව ගංගාව හරස් කරන ලද්දේ වැරදි තැනකින් නිසා බව කියනු ලැබේ. ක්‍රියාත්මක කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් ඇති වෙතැයි යන පදනම මත විකල්ප ස්ථානයක් ගැන විමර්ශනය නොකරන ලදී. (මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන අවස්ථාවේදී පාරිසරික බලපෑම් තක්සේරුවක් කළයුතුය යන නීතිමය නියමයක් නොවූ බව ද සැළකිය යුතුය.)

දැඩි ලෙස ප්‍රමාණයෙන් අඩු කරනු ලැබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් ද අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සැලසුම් කරනු ලැබූ ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග සහිතව සමකාලීනව සංවර්ධනය කරනු ලැබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් ද විකල්ප ගැන සාකච්ඡා කිරීම අවශ්‍ය බැව් එක්සත් ජනපද අධිකරණය පිළිගෙන ඇත. සලකා බැලිය යුතු දර්ශීය විකල්ප කීපයක් පහත විස්තර වේ. :-(9)

1. කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමේ විකල්පය (මෙය තවදුරටත් විස්තර කෙරෙනු ඇත.)

2. තවදුර අධ්‍යයනය කෙරෙන තුරු ක්‍රියා කිරීම කල් දැමීමේ විකල්පය. (ඉහතින් දැක්වූ මැණික් ගග හැරවීමේ යෝජනා ක්‍රමය බලන්න.)

3. එකිනෙකට වෙනස් පාරිසරික බලපෑම් සහිත (ගංවතුර පාලන වැඩසටහන් සඳහා වූ ව්‍යුහගත නොවන විකල්ප සහ මහාමාර්ග ඉදි කිරීම පිළිබඳ විශාල පරිමාණයේ සංක්‍රමණික විකල්ප වැනි) සමාන ප්‍රතිලාභ ගෙනදෙන සැළකිය යුතු වෙනස් ස්වභාවයකින් යුත් ක්‍රියා මාර්ග අවශ්‍ය වන විකල්ප. නිදසුනක් වශයෙන්, කටුනායක අධිවේගී මාර්ගය සම්බන්ධයෙන්, එකී මහා මාර්ගයට ස්ථායී විකල්පයක් වනු ඇත්තේ මහා මාර්ගයක් ඉදිකිරීමේදීට වඩා බොහෝ අඩු පාරිසරික හානියකින් යුක්ත වූ ද, මහා පරිමාණයෙන් ප්‍රවාහන පහසුකම් සළසන්නා වූ ද දුම්රිය මාර්ගයක් බැව් යෝජනා කරනු ලැබ ඇත.

4. වෙනස් පාරිසරික බලපෑම් ඉදිරිපත් කෙරෙන (විදුලිබල යන්ත්‍රාගාරයක් වෙනුවට ශීත පොකුණු සහ ශීත කුළුණු හෝ සැළකිය යුතු අන්දමින් බලශක්ති පරිස්යම් කරන්නා වූ විකල්ප වැනි) යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ විවිධ සැළසුම් හෝ විස්තර වලට අදාළ විකල්ප. නිදසුනක් වශයෙන් කුකුලේ ගග විදුලිබල ව්‍යාපෘතියේ දී, යෝජිත උස් වේල්ල වෙනුවට පහත් වේල්ලක් ගැන සළකා බලනු ලැබූ අතර, අවසානයේ දී මේ විකල්පය පිළි ගන්නා ලදී.

5. මසුන් සහ වන ජීවීන් නැති වී යාම වෙනුවෙන්, ජලාශ සහ ඒවා පිළිබඳ අයිතිවාසිකම් අත්පත් කර ගැනීම ද ඇතුළු වන්දි ලබාදීමේ විකල්ප ක්‍රියාමාර්ග.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලින් ද,

යුක්ති සහගත විකල්පවලින්.

1. විෂය සීමාව සැකසීමේ ක්‍රියාවලිය තුළට එකග වූ ඒවා ඇතුළත් වියයුතු බවත් යුක්ති සහගත නැතැයි පසුව තීරණය වුවහොත් මේ ජේදයෙහි ඊට හේතු සාකච්ඡා කරනු ලැබිය යුතු බවත්.

2. ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයේ බල සීමාවෙන් පරිබාහිරව ක්‍රියාමාර්ග ඇතුළත් කරනු ලැබිය හැකි බවත්

3. යථාර්තවාදී විකල්ප වඩා පරිසීමිත වියහැකි නිසා රජයේ යෝජනාවලට වඩා පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් සීමාවන් ඇති කරනු ලැබිය හැකි බවත්.

4. යෝජිත ව්‍යාපෘතිය අනුමත කරනු ලැබීමෙන් තොරව (වර්තමාන ක්‍රියා මාර්ග මත රැඳී ඇතැයි අදහස් කැරෙන) 'ක්‍රියා නොකිරීමේ' විකල්ප හැම විට ම ඇතුළත් කරනු ලැබිය යුතු බවත්.

5. නිර්දේශ කරනු ලැබූ දෙයට වරණය වශයෙන් විකල්ප ප්‍රතික්ෂේප කිරීමට හේතු සැමවිට ම පැහැදිලි ලෙස දැක්විය යුතු බවත්.

ප්‍රකාශ වේ.

## ක්‍රියා නොකරන විකල්පය

ශ්‍රී ලංකාවේ මෙන්ම එක්සත් ජනපදයේත් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ කාර්ය පටිපාටින්හිදී 'ක්‍රියා නොකරන' විකල්පය විශේෂයෙන් අවධාරණය කරනු ලැබ ඇති බවත් එක්සත් ජනපද නීතිය යටතේ එය බලපෑම් ප්‍රකාශයක විධානාත්මක අංගයක් වන බවත් සැළකිය යුතුය. ජාතික පාරිසරික පනත යටතේ එය පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ අර්ථ නිරූපණයට ඇතුළත් කර නැති නමුත් එය ඇතුළත් කලයුතු බව මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශවල නිශ්චිතව දැක්වේ.

'ක්‍රියා නොකරන' විකල්ප ගැන සළකා බැලීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වන්නේ කවර හෙයින් ද කියාත් එයින් ලබා ගැනීමට නියමිත ප්‍රතිලාභ වෙන වෙන ම දැක්වීමටත් ව්‍යාපෘති යෝජකයාට ඉන් බල කෙරේ. එසේ කිරීමේදී 'මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකළහොත් ඇති විය හැකි තත්ත්වය කුමක්ද?' යන ප්‍රශ්නය කෙරෙහි සැළකිලිමත් වීමට ඔහුගෙන් අපේක්ෂා කෙරෙන අතර ඊට පිළිතුරු දීමේදී, එය ක්‍රියාත්මක කිරීම මුළුමනින් සාධාරණීකරණය කිරීමට තමාට සිදුවන බවද ඔහුට පෙනී යනු ඇත. අනවශ්‍ය වූ හෝ අර්ථවිරහිත වූ හෝ ව්‍යාපෘති යෝජනා කිරීම සහ ක්‍රියාත්මක කිරීම යටත් පිරිසෙයින් වළක්වාලීමට හෝ තහනම් කිරීමට මේ ක්‍රියාදාමය උදව් වේ. එබැවින්, මේ විකල්පය බොහෝවිට බෙහෙවින් ම ස්ථායි එකක් බැව් පෙනී යාම පුදුමයට කරුණක් නොවේ.

'ක්‍රියා නොකරන' විකල්පය පිළිබඳ විශ්ලේෂණය කිරීම අර්ථ විරහිත ක්‍රියාදමයක් නොවන කල්හි එය යුක්ති සහගත එකක් විය යුතුය. කටුනායක අධිවේගී මාර්ගය පිළිබඳ සිද්ධිය ගැන සලකා බැලීමේදී 'ක්‍රියා කිරීමක් නැති' විකල්ප ගැන සලකා බැලිය යුතු බවට නිර්ණාය විෂයයන්ගෙන් නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලද්දේ නම් ඒ ɜ කොළඹ - කටුනායක මාර්ගයේ රථවාහන ගමනාගමනය අධික ලෙස වැඩි වනු ඇති බවත් මේ හේතුකොටගෙන තදාසන්න ප්‍රදේශවලට පාරිසරික පරිහානියක් සිදුවන අතර වාහන අනතුරු වැඩි වනු ඇති බවත් වාර්තාවෙන් හුදෙක් සඳහන් කර තිබුණි. මේ අන්දමේ විශ්ලේෂණයක අඩුලුහුඩුකම් ඉතා පැහැදිලිය.

## විකල්ප සහ ලිහිල් කිරීමේ ක්‍රියා මාර්ග

ජාතික පරිසර පනතේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළිබඳ අර්ථ නිරූපණයේ දී ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් නොවන නමුදු පාරිසරික බලපෑම් තක්සේරුවල අන්තර්ගතය සහ ආකෘතිය යන ජේදය යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශවල එය ඇතුළත් වී ඇත. ලිහිල් ක්‍රියාමාර්ග යනු ව්‍යාපෘතියෙන් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ගයි. නිදසුනක් වශයෙන්, ව්‍යාපෘතියේ විශාලත්වය අඩු කිරීම හෝ යම් නිශ්චිත ක්‍රියා මාර්ගයක් නොගැනීමෙන් එවැනි අහිතකර බලපෑම් මුළුමනින් ම වළක්වාලීම ආදී වශයෙනි.

ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවලින් බොහෝ විට (එහෙත් අනිවාර්යයෙන් ම නොවේ ) යෝජිත ව්‍යාපෘතිය වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සිදු වනු ඇති අතර, එය නැවතත් නව්‍ය විශ්ලේෂණයක් මත රඳා පවතිනු ඇත. නිදසුනක් වශයෙන්, රජවැල්ල ගොල්ෆ් සහ හෝටල් ව්‍යාපෘතියෙහි දී පරිසරයට වියහැකි අහිතකර බලපෑම් පිළිබඳ හේතු මත අවසර දීම ප්‍රතික්ෂේප කරන ලදී.

## ප්‍රාථමික සහ ද්විතියික විකල්ප

ප්‍රාථමික සහ ද්විතියික යනුවෙන් විකල්ප වර්ග කරනු ලැබිය හැකිය. ප්‍රාථමික විකල්ප වලින් ව්‍යාපෘතියක විකල්ප විශ්ලේෂණය කෙරෙන අතර, ද්විතියික විකල්පවලින් ව්‍යාපෘතියක් තුළ ඇති විකල්ප ගැන සාකච්ඡා කෙරේ. නිදසුනක් වශයෙන්, රටේ විදුලිබල උත්පාදනය වැඩි කිරීම අවශ්‍ය යැයි පෙනී යතොත් විශ්ලේෂණයට ලක් විය යුතු ප්‍රාථමික විකල්ප වනු ඇත්තේ තිබෙන විකල්පයන්ය. එනම්, ජල විදුලි බලය, ගල් අගුරු බලය, සුළං හෝ සූර්ය බලශක්තිය ආදියයි. මින් විකල්ප එකක් තෝරා ගනු ලැබූ පසු, නිදසුනක් වශයෙන් ගල් අඟුරු විදුලි බලය තෝරා ගනු ලැබීමෙන් පසු, සළකා බැලීමට අවශ්‍ය වන දෙවැනි විකල්පය වනුයේ ව්‍යාපෘතිය තුළ ඇති විකල්පයයි. එනම්, යන්ත්‍රාගාරය පිහිටුවන ස්ථානය, සැලැස්ම, ගොඩනැගීමේදී භාවිතා කරනු ලබන ද්‍රව්‍ය ආදියයි. ත්‍රිකුණාමලය ගල් අගුරු බලාගාර ව්‍යාපෘතියේ දී ප්‍රාථමික විකල්ප (එනම් ජල, සුළං තරංග හෝ සූර්ය බල ශක්ති විකල්ප) හෝ ද්විතීයික විකල්ප (විකල්ප ස්ථාන හෝ විකල්ප තාක්ෂණය වැනි) යන මේ දෙකින් කවරක් හෝ ප්‍රමාණවත් අයුරින් සැළකිල්ලට නොගනු ලැබූ බව රාජ්‍ය නොවන පාරිසරික ආයතන විසින් චෝදනා කරන ලදී.

ප්‍රාදේශිය/කලාපීය සැළසුම් සහ වැඩ සටහන් සකස් කරනු ලබන විටදී ප්‍රාථමික විකල්ප සිරිත් පරිදි බොහෝ කලින් අවධියකදී අගයනු ලබනවා ඇත. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාවේ පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලිය නියමිත ව්‍යාපෘතිවලට පමණක් අදාළ වන අතර එය ක්‍රියාත්මක වන්නේ පාරිසරික බලපෑම් පිළිබඳ නිසි සැළකිල්ලකින් තොරව ප්‍රාථමික විකල්ප ගැන ඒ වනවිටත් තීරණය ගනු ලැබීමෙන් අනතුරුව ව්‍යාපෘති චක්‍රයේ බොහෝ කල්ගත වූ අවධියකදී ය. මෙය මෙකී ක්‍රියාවලියෙහි අඩුපාඩුවක් වන අතර මේ ගැන සැළකිල්ල යොමු විය යුතුව ඇත.

### රාජ්‍ය සහ පෞද්ගලික අංශ සතුව තිබෙන විකල්ප

සැබෑ විකල්ප වඩාත් පරිසීමිත විය හැකි බැවින් රජයේ යෝජනාවලට වඩා පෞද්ගලික යෝජනා සම්බන්ධයෙන් විකල්ප වඩාත් පරිසීමිත විය හැකි යයි මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශවල සඳහන් වේ. සංවර්ධනය පිළිබඳව ඇති වැඩි වගකීම් ද, වැඩි මූල්‍ය ධාරිතාව මෙන් ම රටේ බොහෝ අංශ කෙරෙහි ඇති ඒකාධිකාරය ද නිසා පෞද්ගලික අංශයටත් වඩා රජය වැඩි විශාලත්වයෙන් යුක්ත වූ ද වඩා සංකීර්ණ වූ ද ව්‍යාපෘතිවල අවශ්‍යයෙන්ම නිරත වනු ඇත. රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අනිවාර්යයෙන් ම මහජන යහපත උදෙසා වනු ඇති අතර, පෞද්ගලික අංශය හෝ පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ඒවා ඔවුන්ගේ ආර්ථික ස්ථායිතාවත් ව්‍යාපෘතිවලින් උපරිම ලාභ ලබා ගැනීම උදෙසාත් සිදු කරනු ලබන ඒවා වනු ඇත. එබැවින්, රජය සතුව පවත්නා ප්‍රාථමික මෙන් ම ද්විතියික විකල්ප යන දෙකට ම අවශ්‍යයෙන් ම පෞද්ගලික අංශයට වඩා පුළුල් විෂය සීමාවක් ඇත. නිදසුනක් වශයෙන්, යම් ඉඩම් ප්‍රමාණයක් හිමි පෞද්ගලික අංශයේ පුද්ගලයෙකු විසින් එය ඔහුට/ඇයට උපරිම ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන කාර්යයන් උදෙසා යොදා ගනු ලැබීමට අදහස් කෙරෙන අතර, මෙහිලා හෝටලයක් ඉදි කිරීම බොහෝ විට ඒ පරමාර්ථය ඉටු කරතැයි පෙනීයේ. ඔහුගේ/ ඇගේ පරමාර්ථය වනුයේ ව්‍යාපෘතියෙන් උපරිම ලාභ ලබා ගැනීම නම් කෙසේ හෝ වේවා තම ප්‍රතිලාභ අඩු කරන වෙනත් විකල්ප සලකා බැලීමට ඔහු/ඇය පසුබට වනු බව ඉතා පැහැදිලිය. කෙසේ වෙතත්, යෝජිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පෞද්ගලික තැනැත්තෙකුට ඇත්තේ වඩා සීමිත පාරිසරික විකල්ප මාලාවක්ම යන කරුණ නිසා බලපෑම් තක්සේරු කාර්ය පටිපාටියේ අවසාන පරමාර්ථ පරිසරයට අවම අහිතකර බලපෑමක් ඇති ප්‍රවර්තනීය සංවර්ධනය සහතික කිරීමය යන්න බැහැර නොකෙරෙන අතර, මේ සාධකය අනෙක් සියල්ල ම අභිබවා සිටී.

### අවසානය

විකල්ප, පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවන්හි අත්‍යවශ්‍ය අංගයක් බවත් නීතියෙන් නියම වූවක් බවත් ඉහත කී විශ්ලේෂණයෙන් පෙනී යයි. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවල විකල්ප ගැන ප්‍රමාණවත් අන්දමින් සළකා බලා නැතැයි යන කාරණය මත ඒවා අභියෝගයට ලක් කළහැකි අතර මේ කාරණය අපගේ අධිකරණවලදී ද මතු වී ඇත. පාරිසරික කළමනාකරණයේ අභිප්‍රාය බලපෑම් තක්සේරු ක්‍රියාවලිය මගින් සපුරා ගැනීමට නම්, ව්‍යාපෘතියේ යෝජකයා ද එමෙන් ම ව්‍යාපෘතිය අනුමත කරන ආයතන ද අධිකරණය සහ මහජනතාව ද එහි විධි විධාන ක්‍රියාවට නැංවිය යුතුවාක් මෙන් ම නම්‍ය වූ ද යුක්ති සහගත වූ ද විකල්ප විශ්ලේෂණයක් මගින් මේ ක්‍රියාවලිය පහසු කෙරෙනු ඇත.

### සටහන්


1. කේ. එච්. ජේ. විජේදාස සහ ඩබ්ලිව්. අයිලප්පෙරුම - "ස්කෙප්" (දකුණු ආසියානු සහයෝගිතා පාරිසරික වැඩසටහන) රටවල් දහයක පාරිසරික ව්‍යවස්ථා සහ ආයතන-ශ්‍රී ලංකා - පරිච්ඡේදය
2. ජාතික පරිසර පනත - 2 වගන්තිය
3. 1988 අංක: 56 දරණ පනත
4. ජෛව ගෝලය සී/ස පාරිසරික පදනමේ ත්‍රෛමාසික ප්‍රකාශනය - කාණ්ඩය 1.
5. මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශ 1502 : 14
6. පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ. අංක: 1 ඒ, ව්‍යාපෘති අනුමත කරන ආයතන සඳහා පොදු මගපෙන්වීම (1993)
7. විලියම් එච්. රොජර්ස් - පාරිසරික නීතිය - පිටුව 792
8. 458 එෆ් 2 ඩී 827 (1972)
9. පාරිසරික බලපෑම් විශ්ලේෂණ සංකල්පය - එස්. කේ. ශුක්ල සහ පී. ආර්. ශ්‍රීවස්තු. සංස්කරණය පොදු රාජ්‍ය මණ්ඩලය.